# වෛෂ්ණව සම්ප්‍රදායාගත බුද්ධාවතාර සංකල්පය පිළිබඳ සංක්ෂිප්ත විමර්ශනයක්

කළුවානේ කුමාරකස්සප හිමි[1]

## හැඳින්වීම

බුද්ධාවතාරය යනු හින්දු සම්ප්‍රදායේ වෛෂ්ණව සම්ප්‍රදායට අයත් සංකල්පයකි. මෙම සංකල්පයට අනුව බුදුන් වහන්සේ විෂ්ණුගේ දස අවතාර අතර නවවෙනි අවතාරය බව ඔවුහු විශ්වාස කරති. හින්දු සම්ප්‍රදායේ බ්‍රහ්ම, විෂ්ණු, මහේශ්වර යන ත්‍රිමූර්තිය ප්‍රධාන සංකල්පයකි. එහි බ්‍රහ්ම යනු ලෝකය නිර්මාණය කරන්නාය. විෂ්ණු යනු ලෝකය මනාව පවත්වාගෙන යන්නාය. ලෝකයේ විනාශය පමුණු වන්නේ ඊශ්වර හෙවත් මහේශ්වරය (රණසිංහ, 2016). මෙම සංකල්පයේ විෂ්ණු වැදගත් මෙහෙවරක් කරනු ලබයි. එනම් ලෝකය පවත්වාගෙන යෑමයි. නිර්මාණයට හෝ විනාශයට වඩා වැඩි අවධානයකින් පවත්වාගෙන යෑම සිදුකළ යුතුවේ. නොමැති නම් නියමිත කාලයට පෙර ලෝකයේ විනාසය ඇතිවේ. උපක්‍රමය නම් මෙම අවතාර ස්වරූපයෙන් මනුලොවට පැමිණ ලෝකයට ශාන්තිය උදාකිරීම බවයි.

බුද්ධාවාතාර සංකල්පය ප්‍රථමයෙන් දැකිය හැකි වන්නේ ව්‍යාස විසින් රචිතැයි සැලකෙන අටළොස් (18) පුරාණ ග්‍රන්ථවලය. නමුත් මෙම පුරාණ ග්‍රන්ථ ක්‍රි.ව. 02 - 13 අතර කාලය තුළ විවිධ ආචාර්ය පරම්පරා යටතේ රචනාවෙන්නට ඇතැයි යන්න, ප්‍රසිද්ධ විද්වත් මතයයි. (Dating of the Puranas) මෙම පුරාණ අතරින් භාගවත, අග්නි, ගරුඩ, ලිංග, හරිවංශ ආදි පුරාණ බුද්ධාවතාර සංකල්පය විස්තර කරන ප්‍රධාන මූලාශ්‍රයෝ වෙති. එසේම ක්ෂේමේන්ද්‍රගේ දශාවතාරචරිතය, ජයදේවගේ ගීතගෝවින්දය වැනි ග්‍රන්ථ තුළ ද මෙම බුද්ධාවතාර සංකල්පය විස්තර වේ.

තමිල්නාඩුවේ මාමල්ලපුර, ආදිවරාහ ගුහාවේ ඇති පල්ලව අක්ෂරයෙන් රචනා වූ 08 වන සියවසයට අයත් බව සැලකෙන ශිලා ලේඛනයයේ මෙම දශාවතාර පිළිබඳව සඳහන්වේ. එහි ඇති ශ්ලෝකය මේ ලෙස දැක්විය හැකිය (රණසිංහ, 2016).

**मत्स्यः कूर्मः वराहश्च नरसिंहश्च वामनः ।**

**रामो रामश्च रामश्च बुद्धः कल्की दशस्मृतः ॥**

එයට අනුව විෂ්ණු දශාවතාර ලෙස මත්ස්‍ය, කූර්ම, වරාහ, නරසිංහ, වාමන, පර්ශුරාම, කෘෂ්ණ, රාම, බුද්ධ, කල්කි යන අවතාර දහය දක්වා ඇත. මෙම අවතාර දහයෙන් නමයක් මේ වනවිට පහළ වී අවසන්ය. තවත් පහළ වීමට ඇත්තේ කල්කි නම් අවතාරය පමණි. එය පහළවන්නේ කලියුග කාලයේ බව දැක්වේ.

අවතරණ හෙවත් අවතාර යනු දෙව්ලොව සිට මෙලොවට පැමිණෙන දෙවියෙකුගේ ශක්ති ප්‍රභවයකි. ප්‍රතිරූපයකි. අවතාර ලෙස මිනිස් ලොවට පැමිණෙන්නේ ලෝකය පවතිනවාට වඩා යහපත් කොට වෙනසක් ඇති කිරීම උදෙසාය.

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය, ශ්‍රී ලංකාව. kassapa@busl.ac.lk

**පර්යේෂණයේ අරමුණු**

01. බුදුන් වහන්සේ විෂ්ණු අවතාරයක් වශයෙන් යොදාගැනීමට හේතු වූ පදනම කුමක් ද? යන්න අධ්‍යයනය කිරීම

02. බුද්ධාවතාර සංකල්පය විග්‍රහ කළ ආකාරය අධ්‍යයනය කිරීම

03. හින්දූන් බුදුන් වහන්සේට දැක්වූ ගෞරවය හා පිළිගැනීම අධ්‍යයනය කිරීම

**පර්යේෂණයේ වැදගත්කම**

හින්දු ආගම ආස්තිකවාදී ආගමක් ලෙස හෙවත් වේදය මූලික කරගත්ත ආගමක් වශයෙන් හඳුන්වා දිය හැකිය. නමුත් බෞද්ධ යනු නාස්තිකවාදී ආගමක් හෙවත් වේදය ප්‍රතික්ෂේප කළ ආගමකට එහාගිය දර්ශනයක් බව හඳුනාගත හැකිය. මෙසේ එකිනෙකට වෙනස්ම සංකල්ප දෙකක් එකම මාවතකට ගැනීම, බුදුන් වහන්සේ අවතාරයක් කොට විෂ්ණුට සම්බන්ධ කිරීම තුළින් පෙනේ.

බෞද්ධ මහායාන මූලාශ්‍රය භාවිතයෙන් බුදුන් වහන්සේ පිළිබඳව නොයෙකුත් විද්වත්හු නොයෙකුත් ශාස්ත්‍රීය පර්යේෂණ මෙන්ම දාර්ශනික පර්යේෂණ හා ඉගැන්වීම් සිදු කොට ඇත. නමුත් මෙම හින්දු සංකල්ප සන්ධර්භය තුළ බුද්ධාවතාර සංකල්පය ඇතිවීමට හා ව්‍යාප්ත වීම පිළිබඳ තොරතුරු අල්ප වෙයි. එහෙයින් බුද්ධාවතාර සංකල්පය විග්‍රහකළ ආකාරය හා බුදුන් වහන්සේ විෂ්ණු අවතාරයක් වශයෙන් යොදාගැනීමට හේතුවූ පදනම කුමක් ද? යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම ඉතා වැදගත්ය.

**සාහිත්‍ය විමර්ශනය**

මෙම පර්යේෂණය සඳහා තෝරාගත් පුරාණ ග්‍රන්ථ කිහිපයක උධෘත හා ක්ෂේමේන්ද්‍රගේ දසාවතාරචරිතම් වැනි ග්‍රන්ථ සාහිත්‍ය මූලාශ්‍රය ලෙස තෝරා ගනිමින් වෛෂ්ණවයන් බුදුන් වහන්සේ අවතාර සංකල්පයට ඇතුළත් කිරීමට හේතු වූ පදනම අධ්‍යයනය කරන්නට අපේක්ෂා කෙරෙයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සම්පූර්ණ කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරනුයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අයත් ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදයයි.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

බුදුන් වහන්සේ විෂ්ණු අවතාරයක් වශයෙන් යොදා ගැනීමට හේතු වූ මූලික පදනම විමසීමේදී ප්‍රථමයෙන් හඳුනාගත හැක්කේ එය විශ්වීය පිළිගැනීමක් නොවන බවයි. මෙම සංකල්පය පිළිබඳ අභ්‍යන්තර හින්දු විවාද මෙන්ම බෞද්ධ හා සමාජ විරෝධතාද පවතී. දාර්ශනික සංකල්පවලට වඩා ඓතිහාසික සහ සමාජ දේශපාලන අවශ්‍යතා මත මෙකී ඒකාබද්ධතාව කළ බව විද්වත් විශ්ලේෂණවලින් පෙනී යයි.

ක්‍රි.ව. පළමු සියවසයේ මුල් භාගය වන විට, බෞද්ධ දර්ශනය විශාල ජනප්‍රියත්වයක් ලබාගෙන තිබූ අතර, එය බ්‍රාහ්මණික සම්ප්‍රදායේ ආධිපත්‍යයට දැඩි අභියෝගයක් එල්ල කළේය. බුදු දහම ජනතාව අතර ව්‍යාප්ත වීමට එක් ප්‍රධාන හේතුවක් වූයේ බ්‍රාහ්මණ කුල ක්‍රමය සහ දැඩි චාරිත්‍ර වාරිත්‍ර ප්‍රතික්ෂේප කිරීමයි.

වෛෂ්ණවයන් සහ බෞද්ධයන් අතර තිබූ විරසකය, දෙකම වන්දනාමාන කළ සහ දෙක අතර වෙනස හඳුනා නොගත් සාමාන්‍ය ජනතාවට එතරම් වැදගත් නොවූ බව දැක්විය යුතුය. මෙම බෙදීම වැදගත් වූයේ බ්‍රාහ්මණ ප්‍රජාවට සහ භික්ෂුවට පමණි. ඔවුන් තම චාරිත්‍ර වාරිත්‍ර, ආරාම සඳහා රාජකීය අනුග්‍රහය අපේක්ෂා කළ ප්‍රතිවාදීන් ද විය (Pattanaik, 2017).

ඩොනිගර් (Doniger) වැනි විද්වතුන් තර්ක කරන්නේ, බුදුන් වහන්සේ අවතාරයක් වශයෙන් ඇතුළත් කිරීමේ ප්‍රධාන හේතුව නම් බුදු දහම විසින් එල්ල කරන ලද තර්ජනයට බ්‍රාහ්මණික සම්ප්‍රදායන් දැක් වූ උපායශීලී ප්‍රතිචාරයක් බවයි. මෙම උපාය මාර්ගය තුළින් ආගමික සමමුහුර්තය පමණක් නොව, ප්‍රතිවාදියා යටත් කිරීම ද සිදුවිය (Doniger, 1994: 175).

ජෝන් හෝල්ට්ගේ (John Holt) විශ්ලේෂණයට අනුව, බුදුන් වහන්සේ විෂ්ණුගේ අවතාරයක් බව ප්‍රකාශ කිරීමෙන්, බ්‍රාහ්මණ සම්ප්‍රදාය විසින් බුදුන් වහන්සේගේ අධිකාරය විෂ්ණුගේ අධිකාරියට යටත් කරන ලදී. බුදුන් වහන්සේව අවතාර ලැයිස්තුවට ඇතුළත් කිරීම, ඉන්දියානු දේශපාලනයේ හා බ්‍රාහ්මණික වෛෂ්ණව දෘෂ්ටිවාදය තුළ බුදුන් සහ බෞද්ධ සංස්කෘතිය යටත් කිරීමකි. මෙයින් බෞද්ධ දර්ශනයට තිබූ රාජ්‍ය අනුග්‍රහය හා ස්වාධීන තත්ත්වය දුර්වල වීමක් සිදු වූ බව ද හෙතෙම පෙන්වා දේ (Holt, 2008: 18).

ඉහත දැක්වූ බුද්ධාවතාරයේ පදනම ඉන්දියාවේ බුදු දහම ක්‍රමානුකූලව පරිහානියට ලක්වීමට පදනම සැකසිණි. බුදුන් වහන්සේ හින්දු දේව මණ්ඩලයට උකහා ගැනීම හේතුවෙන් බෞද්ධ දර්ශනය හින්දු ආගමේම සෞන්දර්යාත්මක, භක්ති ශාඛාවක් වශයෙන් සමකාලීන ජනතාව අතර වැරදි පිළිගැනීමක් ඇති විය.

වෛෂ්ණව සම්ප්‍රදාය විසින් බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වලට එරෙහිව සෘජුව සටන් කරනවා වෙනුවට, සදාචාරාත්මක බලය පිළිගෙන එය තමන්ගේම ව්‍යුහය තුළට විස්ථාපනය කිරීම දාර්ශනික සංවාදයකින් ජය ගැනීමට වඩා දේශපාලනිකව හා ආගමික වශයෙන් වඩාත් ඵලදායී විය.

ඇතැම් සමකාලීන හින්දු භක්තිකයන් ද ගෞතම බුදුන් වහන්සේ විෂ්ණු අවතාරයක් වශයෙන් හඳුනා ගැනීම පුරාණ ග්‍රන්ථ උපුටා දක්වමින් ප්‍රතික්ෂේප කරති. ගෞඩි වෛෂ්ණව සංකල්පයේ ඇතැම් ආචාර්යවරුන් තර්ක කරන්නේ, භාගවත පුරාණය (1.3.24) ශ්ලෝකයේ ඇතුළත් ''බුද්ධො නාම්නාඤ්ජනසුතඃ'' යන්න දක්වමින්'' ''අඤ්ජානගේ පුත්‍රයා'' ක්‍රි.පූ. 1800 දී පමණ උපත ලැබූ විෂ්ණු අවතාරය, මායා දේවියට සහ ශුද්ධෝදනට දාව උපත ලැබූ ගෞතම බුදුන් වහන්සේ නොවන බවයි. අමරකෝෂය සහ වෙනත් බෞද්ධ ග්‍රන්ථ මත පදනම්ව, සුගත බුද්ධ සහ ආදී බුද්ධ වැනි විරුද්ධ නාම ගෞතම බුදුන් වහන්සේට නොව, විෂ්ණු අවතාරයට යොදා ඇති බවද දක්වයි (Keshava, *2003: 42).*

දශාවතාරචරිතම් කාව්‍යයට අනුව බුද්ධාවතාරය වශයෙන් හඳුන්වා ඇත්තේ බෞද්ධයන්ගේ ගෞතම බුදුන්ම බව පෙනේ. සිද්ධාර්ථ කුමරු විසින් ප්‍රකාශ කරන ලද උදාන වාක්‍යයට සමාන උදානයක් ද එහි විස්තර වේ.

**मायाभिधाना नरनाथपत्नी गर्भे हरिं विश्वगुरुं वहन्ती ।**

**आसन्न चन्द्रेव सिधाब्धिवेला निधानधन्येव वसुन्धराभूत् ॥**

(Ksemendra, 1891: 3 Pdf 154. Book 151)

(මායා නම් වූ, රජුගේ පතිනියගේ කුසෙහි පාප නසන්නා වූ විශ්ව ගුරු වූ හරි (විෂ්ණු) දරා සිටිනුයේ, ළඟා වූ සඳ ඇති අමෘත සයුරෙහි වෙරළ මෙන් ද, නිධානයකින් වාසනාවන්ත වූ පොළොව මෙන් ද වූවාය.

**पूर्णव्या स्थित्यं मम निर्वृत्तिर्मे धीः सर्वसत्त्वेष्वद्वैतबुद्धिरिति कथ्यते ।**

**जन्मस्थितिः सम्प्रति प्रच्छन्नं संसारबन्धादिह मुक्तता च ॥**

(Ksemendra, 1891: 6 Pdf 154. Book 151)

(උන්වහන්සේ දිශා දෙසට පිය නඟා මෙසේ පැවසූ සේක. මේ පූර්ව දිශාව මාගේ නිවන වේ. මේ දක්ෂිණ දිශාව සියලු සත්වයන් උදෙසා දැක්වූ මාගේ ප්‍රඥාව හා දක්ෂිණාව වේ. මේ පශ්චිම දිශාව මාගේ උපතේ අවසාන භවය වේ. මේ උතුරු දිශාව සංසාර බන්ධනයෙන් මිදීම වේ)

වෛෂ්ණව බ්‍රහ්මණ සම්ප්‍රදාය බුදු දහමෙන් සහ ජෛන දහමෙන් දැඩි දාර්ශනික හා සමාජීය අභියෝගයකට මුහුණ දුන් ක්‍රි.ව. 5 වන සියවසයෙන් පමණ පසු මෙම සංකල්පය ඇති විය. බුදුන් වහන්සේව අවතාරයක් වශයෙන් පිළිගැනීමෙන්, හින්දු දහමට බුදුන්ගේ බලය යටත් කිරීමටත්, බුදු දහම වෙනම, ස්වාධීන ආගමක්ව තිබූ තත්ත්වය උදාසීන කිරීමටත් හැකි විය. බුදුන් වහන්සේ අවතාරයක් වශයෙන් ඇතුළත් කිරීම, බුදු දහම ඉන්දියාව තුළ ක්‍රමානුකූලව පරිහානියට පත්වීමට මූලික හේතුවක් ද විය. බුදු දහම හින්දුන්ගේ විශාල ආගමික ව්‍යුහය තුළට උකහා ගැනීමෙන්, ඉන්දියානු සමාජය සදාචාරාත්මක අංගයන් පදනම් කරගත් සමාජයක් වශයෙන් ස්ථාපිත කිරීමට අවස්ථාව ලැබුණි. අවතාරයක් ලෙස බුදුන් වහන්සේගේ භූමිකාව ඉන්දීය ආගමික ඉතිහාසයේ සංකීර්ණතම අවශෝෂණ ක්‍රියාවලියක උච්චතම අවස්ථාව නිරූපණය කරන අතර, එය ආගමික සම්ප්‍රදායන් තරඟ කරන ආකාරය සහ එකිනෙකට බලපෑම් කරන ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විද්වත් අධ්‍යයනයක් ඉදිරිපත් කරයි. මෙම සංකල්පය හින්දු දහමේ ඇති ආගමික නම්‍යශීලීභාවය සහ ප්‍රතිවාදී ආගම් සමඟ කටයුතු කිරීමේ උපායශීලී බව මනාව පෙන්වා දෙති.

## නිගමනය

ගෞතම බුදුන් වහන්සේව විෂ්ණු දශාවතාර අතර නවවන අවතාරය වශයෙන් වෛෂ්ණව දේව මණ්ඩලයට ඒකාබද්ධ කිරීම, ඉන්දියානු ආගමික ඉතිහාසය තුළ දක්නට ලැබෙන වඩාත්ම සංකීර්ණ ආගමික සංශ්ලේෂණයන්ගෙන් එකකි. මෙය හුදෙක් එකවර

සිදු වූ සිදුවීමක් නොව, සියවස් ගණනාවක් පුරා දිග හැරුණු බහුවිධ ක්‍රියාවලියකි. මෙය බෞද්ධ සදාචාරධර්ම නැවත අර්ථකථනය කිරීමක් හා වෛදික චාරිත්‍රවල පිළිවෙත් ප්‍රතිසංස්කරණය කිරීමක් ද වේ. ක්‍රිස්තු වර්ෂ පළමු සහස්‍රය තුළ පැවති වෙනස් වන සමාජ දේශපාලනික තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමක් බව ද හැඳින්විය හැකිය.

බෞද්ධ සහ ජෛන වැනි දර්ශනික සංකල්පයන්ට ඉහළ ජනප්‍රියතාවක් ඇතිවීම හේතුවෙන් බ්‍රාහ්මණ සම්ප්‍රදාය මුහුණ දුන් අර්බුදය හේතුවෙන් බුදුන් වහන්සේගේ කරුණාව සහ අවිහිංසාව පිළිබඳ ඉගැන්වීම් පිළිගන්නා ලදී. වෛදික දෘෂ්ටියේ අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා අනුගමනය කළ උපායමාර්ගයක් වශයෙන් මෙම ඇතුළත් කරගැනීම හඳුනා ගත හැකිය.

11 වන සියවසේ සිට 13 වන සියවස දක්වා කාලයේ පුරාණවල පැවති විවේචනාත්මක ස්වරූපය මෘදු විය. බුදුන් වහන්සේ අසුරයන් මුළා කරන්නෙකු ලෙස නොව, දූෂිත වෛදික චාරිත්‍රවලින් හිංසනයට ලක් වූ අහිංසක සතුන් බේරා ගැනීමට පැමිණි කරුණාවන්ත ආචාර්යවරයෙකු ලෙස හඳුන්වනු ලැබීය. ඒ බව ක්ෂේමේන්ද්‍රගේ බුද්ධාවතාරය හා පසු කාලීන ගීතගෝවින්දය මගින් ද ප්‍රකට වේ. මෙම වෙනස මගින් හින්දු ආගම තුළ සිදු වූ අභ්‍යන්තර ප්‍රතිසංස්කරණ සහ චාරිත්‍රවලට වඩා භක්තියට, සදාචාරයට මුල් තැන දුන් ආකාරයද පිළිබිඹු වේ.

බුදුන් වහන්සේ අවතාරයක් වශයෙන් නම් කිරීම ප්‍රතිවාදී දහම අඩපණ කිරීමේ සාර්ථක උපක්‍රමයක් විය. බුදුන් විෂ්ණුගේ අවතාරයක් නම්, උන්වහන්සේගේ අනුගාමිකයන් ද විෂ්ණුගේ භක්තිකයන් වන බැවින් බෞද්ධ සහ හින්දු අතර සීමා බිඳී ගියේය. උන්වහන්සේ විෂ්ණුගේ කොටසක් බවට පත් කිරීමෙන් ස්වාධීන විප්ලවවාදී චරිතයකට වඩා විෂ්ණුගේ සැලසුමක මෙවලමක් බවට පත් කළේය. තව ද බුදුදහමේ තිබූ උසස් සදාචාරධර්ම, හින්දු දහමට ඇතුළත් කිරීමෙන් පෞරාණික හින්දු දහම වඩාත් ආකර්ෂණීය විය.

**ප්‍රමුඛ පද** - දශාවතාර, බුද්ධාවතාර, විෂ්ණු, හින්දු, ක්ෂේමේන්ද්‍ර

**ආශ්‍රිත ග්‍රන්ථ**

Bhakti Prajnan Keshava. (2003). *Beyond Nirvana: The Philosophy of Mayavadism: A Life History*. Gaudiya Vedanta Publications.

Doniger, W. (1994). *Hindu Myths*. New Delhi: Penguin Books India.

Holt, J.C. (2008). *The Buddhist Viṣṇu: Religious Transformation, Politics, and Culture*. Delhi: Motilal Banarsidass.

Jayadeva. (1899). *The Gīta-Govinda of Jayadeva: With the Commentaries Rasikapriya of King Kumbha and Rasamañjarī of Mahāmahopādhyāya Śaṅkara Miśra*. Edited by M.R. Telang and W.L. Pansikar. Bombay: Tukârâm Jâvaji, Proprietor of Javaji Dadaji's *Nirṇaya-Sāgara* Press.

Kṣemendra. (1891). *The Daśāvatāracarita of Kṣemendra*. Edited by Durgāprasād and Kāśīnath Pāṇḍuraṅga Parab. Bombay: Nirṇaya-Sāgara Press.

Vyas, V. (n.d.) *Śrī Harivaṃśapurāṇa*. Gorakhpur: Gita Press.

රණසිංහ, සමන් චන්ද්‍ර. (2016). *අවතරණ*, නුගේගොඩ: විදුදය ප්‍රකාශන.

'Dating of the Puranas' (n.d.) *Purana Bulletin*. Available at: https://www.wisdomlib.org/hinduism/journal/purana-bulletin/d/doc1456053.html (Accessed: 24 June 2025).